අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சரின் அலுவலகம்
PRIME MINISTER'S OFFICE

58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, ஸ்ரீமத் ஏர்னஸ்ட் த சில்வா மாவத்தை, கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ යොමුව<br>எனது குறியீடு<br>My Ref. | PMO/01/01/01 | ඔබේ යොමුව<br>உமது குறியீடு<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2020.10.22 |

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන් වෙත,

**ග්‍රාමීය ආර්ථිකය නඟාසිටුවීමේ ජාතික වැඩසටහන**

අතිගරු ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් බිහිකිරීම සඳහා රජය විසින් ක්‍රියාත්මක කරන ජාතික ආර්ථිකය ගොඩනැගීමේ වැඩපිළිවෙළට සමගාමීව ග්‍රාමීය ආර්ථිකය නඟාසිටුවීමේ අවශ්‍යතාව ප්‍රමුඛතම කාර්යයක් ලෙස රජය විසින් හඳුනාගෙන ඇත. මෙම කාර්යය සාක්ෂාත් කර ගැනීම සඳහා **ග්‍රාමීය ආර්ථිකය නඟාසිටුවීමේ ජාතික වැඩසටහන** හඳුන්වා දී ඇත. මේ පිළිබඳව 2020.10.15 දින පැවැති දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ සමුළුවේ දී ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධන බලකායේ සභාපති, ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා විසින් ඔබ දැනුවත් කරන ලදි.

දිස්ත්‍රික් විමධ්‍යගත අයවැය යටතේ ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක වැඩසටහන් ක්‍රමානුකූලව පෙළගස්වා ක්‍රියාත්මක කිරීම දිස්ත්‍රික් සංවර්ධන කමිටුව මඟින් අධීක්ෂණය හා මෙහෙයවීම සිදු කරනු ලබයි. ඒ ආකාරයටම, කැබිනට් අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශ ජාතික මට්ටමින් ක්‍රියාත්මක කරන වැඩසටහන් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටම දක්වා ගලායාම මෙන්ම ජනතා අවශ්‍යතා හඳුනාගෙන ඒවා ඉහළට ගලායාම තහවුරු කිරීම අවශ්‍ය වේ.

එහෙයින්, කැබිනට් අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශ විසින් ක්‍රියාත්මක කරන වැඩසටහන්වල ප්‍රතිඵල ප්‍රාදේශීය මට්ටමින් ජනතාවට ලබා කර ගැනීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් අවශ්‍ය වේ. එම යාන්ත්‍රණය සකස් කිරීම පහසු කිරීම සඳහා ප්‍රාදේශීය වශයෙන් රාජ්‍ය අමාත්‍යාංශ සපයන සේවාවන් පදනම් කරගෙන පහත සඳහන් ආකාරයට එම අමාත්‍යාංශ කාණ්ඩ (Cluster) හතරකට වර්ග කර ඇත.

1. සමාජීය යටිතල පහසුකම් සංවර්ධන කමිටුව
2. ජීවනෝපාය සංවර්ධන කමිටුව
3. දේශීය නිෂ්පාදන කර්මාන්ත වැඩිදියුණු කිරීමේ සංවර්ධන කමිටුව
4. ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන කමිටුව

කාර්යාලය / அலுவலகம் / Gen. Office: 2575317, 2575318
ෆැක්ස් / பெக்ஸ் / Fax: 2574143, 2575454, 2575310
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail: secpm@pmoffice.gov.lk

මෙම වැඩසටහනේ දී, එම කාණ්ඩ නියෝජනය කරන කැබිනට් අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන් හා ලේකම්වරුන් කාලසටහනකට අනුව එක් එක් දිස්ත්‍රික්වලට පැමිණීමට අපේක්ෂිත ය. එම කමිටු නියෝජනය කරන අමාත්‍යවරුන්ගේ ලේඛනය මේ සමඟ අමුණා ඇත. එමඟින්, පහත සඳහන් අරමුණු ලඟා කරගැනීමට බලාපොරොත්තු වේ.

I. එහිදී අමාත්‍යාංශ තුළින් සපයන සේවාවන් පිළිබඳ දැනුවත් කිරීම
II. දිස්ත්‍රික්කයේ මහජන නියෝජිතයින් හා මහජනතාව ඉහත සඳහන් ක්ෂේත්‍රවලට අදාළ ව මුහුණපාන ගැටළුවලට විසඳුම් ලබාදීම
III. එම අමාත්‍යාංශ අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකට සම්බන්ධ වී ප්‍රාදේශීය අනන්‍යතාවයන් හා විභවයන් හඳුනාගැනීම සහ ආංශික සැලසුම් සකස් කිරීම
IV. දිස්ත්‍රික් මට්ටමින් මහජන නියෝජිතයින් හා රාජ්‍ය අමාත්‍යවරුන් අතරත්, රාජ්‍ය නිලධාරීන් අතරත් අන්‍යෝන්‍ය සහසම්බන්ධයක් ගොඩනැගීම තුළින් ජාතික මට්ටමේ ඉලක්ක, එක් එක් දිස්ත්‍රික්කවල මහජනතාවගේ අවශ්‍යතා සපුරාලන අයුරින් ලඟාකර දීම

මෙම දිස්ත්‍රික් රැස්වීම සංවිධානය කිරීමේ දී ප්‍රධාන වශයෙන් එම අමාත්‍යාංශවලට අදාළ ව මහජනතාව හා මහජන නියෝජිතයින් හඳුනාගත් ගැටළු ඒවායේ ප්‍රමුඛතාවය අනුව ලේඛනගත කොට එහි ඉහළ ප්‍රමුඛත්වයක් දැක්විය යුතු ගැටළු කෙරෙහි වැඩි අවධානයක් යොමු කොට ඊට අදාළ වගකිවයුතු නිලධාරීන්ට මෙම වැඩසටහනට සහභාගී වන ලෙස ආරාධනා කළ හැකිය. එහිදී, එම ගැටළු පිළිබඳ අදාළ නිලධාරීන් රැස්වීමට පෙර දැනුවත් කිරීම වඩා ඵලදායී වේ. තවද, එක් අමාත්‍යාංශයකින් පමණක් යම් ගැටළුවක් නිරාකරණය කිරීමට දුෂ්කර අවස්ථාවල දී ඊට අදාළ අනෙකුත් අමාත්‍යාංශ සම්බන්ධ කරගත හැකිය. එලෙසම එම ක්ෂේත්‍රය නියෝජනය කරන පෞද්ගලික ව්‍යවසායකයින්ට/ ආයෝජකයන්ට ද මෙම රැස්වීමට ආරාධනා කිරීම වඩාත් ප්‍රතිඵලදායක විය හැකිය.

මෙම වැඩසටහනට අදාළ ව එක් එක් අමාත්‍යාංශවල වැඩසටහන්, ව්‍යාපෘති සහ ඒවායේ ප්‍රගතිය මැනිය හැකි ආකාරයට ජාලගත තොරතුරු පද්ධතියක් (Web based system) ඉදිරියේ දී සකස් කරනු ඇත. එමඟින් දිස්ත්‍රික් ලේකම්වරුන්ට, රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්ට හා කැබිනට් අමාත්‍යාංශ ලේකම්වරුන්ට අමාත්‍යාංශවල දිස්ත්‍රික් මට්ටමින් ව්‍යාපෘතිවල ප්‍රගතිය ඊට ඇතුළත් කළ හැකි අතර, එම තොරතුරු මුල් අවස්ථාවේ දී එක් වරක් පමණක් ඇතුළත් කර එය යාවත්කාලීන කිරීම තුළින් අනවශ්‍ය ලෙස ලිපි හුවමාරුව නවත්වා ගත හැකි වනු ඇත.

මූලික වශයෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කර මාසිකව ප්‍රගතිය සමාලෝචනය කර තෙමසකට පසු පූර්ණ ඇගයීමකට ලක්කිරීමට අපේක්ෂිත ය. එහිදී සෑම නිලධාරියෙක්ම තමන් සතු වගකීම් නිසි පරිදි ඉටු කරනු ඇතැයි අපේක්ෂා කරමි. මෙම වැඩසටහන සියලුම අමාත්‍යාංශ හා දිස්ත්‍රික් අතර සම්බන්ධීකරණය අග්‍රාමාත්‍ය කාර්යාලයේ සංවර්ධන අංශයේ, අග්‍රාමාත්‍ය අතිරේක ලේකම්(සංවර්ධන) විසින් සිදු කරයි. (011-7124410, 077-7005446)

ජාලගත තොරතුරු පද්ධතියක් සකස් කරන තෙක් භාවිතා කළ හැකි ආකෘතියක් සකස් කර රාජ්‍ය අමාත්‍යාංශවලට හා දිස්ත්‍රික් ලේකම්වරුන්ට ලබාදීමට කටයුතු කරනු ලැබේ. දිස්ත්‍රික් මට්ටමින් මෙම රැස්වීම සංවිධානය හා ප්‍රගති සමාලෝචනය කිරීම දිස්ත්‍රික් ලේකම්වරුන්ට පැවරේ. තවද, පවතින කොරෝනා වසංගතය හේතුවෙන් අදාළ සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේදයන් අනුගමනය කරමින් සෞඛ්‍ය අංශයේ බලධාරීන්ගෙන් විමසා අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම වඩාත් යෝග්‍ය ය. රැස්වීමකට සහභාගීවන නිලධාරීන් සංඛ්‍යාව අවම මට්ටමක පවත්වා ගත යුතු ය. උදාහරණක් ලෙස දිස්ත්‍රික්කයේ අධ්‍යාපන ගැටලු සම්බන්ධව සාකච්ඡා කිරීමට පළාත් මට්ටමින් සහභාගීත්වය අවශ්‍ය වන්නේ පළාත් අධ්‍යාපන ලේකම්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හා ගැටලුවට අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ පමණි.

මෙම කමිටු හතරෙහි රැස්වීම් අවශ්‍ය නම් එක් දිනක වුවද පැවැත්විය හැකිය. තම දිස්ත්‍රික්කයේ රැස්වීම් කාලසටහන සමස්ත වැඩසටහනට බාධාවක් නොවන පරිදි වෙනස් කර ගත හැකිය. තවද, ඔබ පළාතේ ගරු ආණ්ඩුකාරවරුන්, මහජන නියෝජිතයින් හා පළාත් සභාවේ අදාළ නිලධාරින් ද මෙම රැස්වීමට සහභාගී කර ගැනීමට කටයුතු කළ මැනවි.

**ගාමිණී එස්. සෙනරත්**
අග්‍රාමාත්‍ය ලේකම්

පිටපත්:

1. ජනාධිපති ලේකම් - කාරුණික දැනගැනීම සඳහා
2. සියලුම කැබිනට් අමාත්‍යාංශ ලේකම්වරුන්
3. සියලුම ප්‍රධාන ලේකම්වරුන්
4. සියලුම රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්

(2–4) - කාරුණික දැනගැනීමට හා අවශ්‍ය කටයුතු සඳහා

5. සියලුම ආණ්ඩුකාර ලේකම්වරුන් - ගරු ආණ්ඩුකාරවරුන් දැනුවත් කිරීම සඳහා
6. මුදල් කොමිෂන් සභාවේ ලේකම් - කාරුණික දැනගැනීම සඳහා

# ග්‍රාමීය ආර්ථිකය නඟාසිටුවීමේ
## ජාතික වැඩසටහන

# සමාජීය යටිතල පහසුකම් සංවර්ධන කමිටුව

**අමාත්‍ය මණ්ඩල නියෝජිතයන්**

ගරු ජී.එල්. පීරිස් මැතිතුමා - අධ්‍යාපන අමාත්‍ය
ගරු පවිත්‍රා වන්නිආරච්චි මැතිණිය - සෞඛ්‍ය අමාත්‍ය
ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා - තරුණ හා ක්‍රීඩා අමාත්‍ය

| අනු අංකය | රාජ්‍ය අමාත්‍යාංශය | රාජ්‍ය අමාත්‍ය |
|---|---|---|
| 01. | විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපොළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය | ගරු ප්‍රියංකර ජයරත්න මැතිතුමා |
| 02. | සමූපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාර්භෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය | ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා |
| 03. | ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය | ගරු විදුර වික්‍රමනායක මැතිතුමා |
| 04. | දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය | ගරු විජිත බේරුගොඩ මැතිතුමා |
| 05. | පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය | ගරු සරත් වීරසේකර මැතිතුමා |
| 06. | ග්‍රාමීය හා පාසැල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | ගරු තේනුක විදානගම මැතිතුමා |
| 07. | දේශීය වෙදකම ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය | ගරු සිසිර ජයකොඩි මැතිතුමා |
| 08. | කාන්තා හා ළමා සංවර්ධන, පෙරපාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය | ගරු පියල් නිශාන්ත මැතිතුමා |
| 09 | නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය | ගරු සීතා අරඹේපොල මැතිතුමිය |

අග්‍රාමාත්‍ය කාර්යාලය

# ග්‍රාමීය ආර්ථිකය නඟාසිටුවීමේ
## ජාතික වැඩසටහන

## ජීවනෝපාය සංවර්ධන කමිටුව

### අමාත්‍ය මණ්ඩල නියෝජිතයන්

ගරු සී.බී රත්නායක මැතිතුමා - වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍ය
ගරු මහින්දානන්ද අළුත්ගමගේ මැතිතුමා - කෘෂිකර්ම අමාත්‍ය
ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමා - සංචාරක අමාත්‍ය

| අනු අංකය | රාජ්‍ය අමාත්‍යාංශය | රාජ්‍ය අමාත්‍ය |
|---|---|---|
| 01. | ඉඩම් කළමනාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපල සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | ගරු රොෂාන් රණසිංහ මැතිතුමා |
| 02. | සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | ගරු ශෙහාන් සේමසිංහ මැතිතුමා |
| 03. | පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශය | ගරු මොහාන් ද සිල්වා මැතිතුමා |
| 04. | වාහන නියාමනය, බස්රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය | ගරු දිලුම් අමුණුගම මැතිතුමා |
| 05. | වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙළවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | ගරු විමලවීර දිසානායක මැතිතුමා |
| 06. | ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | ගරු අනුරාධ ජයරත්න මැතිතුමා |
| 07. | පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ව පාලනය හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | ගරු එස්. වියාලේන්ද්‍රන් මැතිතුමා |
| 08. | පශු සම්පත් ගොවිපොල ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය | ගරු ඩී.බී. හේරත් මැතිතුමා |
| 09. | වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්,ලූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය | ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා |

අග්‍රාමාත්‍ය කාර්යාලය

# ග්‍රාමීය ආර්ථිකය නඟාසිටුවීමේ
## ජාතික වැඩසටහන

# දේශීය නිෂ්පාදන කර්මාන්ත වැඩිදියුණු කිරීමේ සංවර්ධන කමිටුව

### අමාත්‍ය මණ්ඩල නියෝජිතයන්
ගරු ඩග්ලස් දේවානන්ද මැතිතුමා - ධීවර අමාත්‍ය
ගරු විමල් වීරවංශ මැතිතුමා - කර්මාන්ත අමාත්‍ය
ගරු රමේෂ් පතිරණ මැතිතුමා - වැවිලි අමාත්‍ය

| අනු අංකය | රාජ්‍ය අමාත්‍යාංශය | රාජ්‍ය අමාත්‍ය |
|---|---|---|
| 01. | බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය | ගරු දයාසිරි ජයසේකර මැතිතුමා |
| 02. | පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදනය හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය | ගරු අරුන්දික ප්‍රනාන්දු මැතිතුමා |
| 03. | සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | ගරු කනක හේරත් මැතිතුමා |
| 04. | උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | ගරු ජානක වක්කුඹුර මැතිතුමා |
| 05. | මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය | ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමා |
| 06. | විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය | ගරු කංචන විජේසේකර මැතිතුමා |
| 07. | වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ | ගරු ප්‍රසන්න රණවීර මැතිතුමා |

අග්‍රාමාත්‍ය කාර්යාලය

# ග්‍රාමීය ආර්ථිකය නඟාසිටුවීමේ
## ජාතික වැඩසටහන

# ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන කමිටුව

**අමාත්‍ය මණ්ඩල නියෝජිතයන්**
ගරු චමල් රාජපක්ෂ මැතිතුමා - වාරිමාර්ග අමාත්‍ය
ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා - විදුලිබල අමාත්‍ය
ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමා - මහාමාර්ග අමාත්‍ය

| අනු අංකය | රාජ්‍ය අමාත්‍යාංශය | රාජ්‍ය අමාත්‍ය |
|---|---|---|
| 01. | සූර්යබල, සුලං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | ගරු දුමින්ද දිසානායක මැතිතුමා |
| 02. | ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | ගරු නිමල් ලන්සා මැත්තුමා |
| 03. | ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | ගරු ඉන්දික අනුරුද්ධ මැතිතුමා |
| 04. | ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | ගරු සනත් නිශාන්ත මැතිතුමා |
| 05. | මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | ගරු සිරිපාල ගම්ලත් මැතිතුමා |
| 06. | නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය | ගරු නාලක ගොඩහේවා මැතිතුමා |
| 07. | වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය | ගරු ජීවන් තොණ්ඩමන් මැතිතුමා |